# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව
## බාහිර විභාග අංශය
## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
## වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි ප්‍රථම වර්ෂ පරීක්ෂණය (බාහිර) 2009
## 2010 ඔක්තෝබර්/නොවැම්බර්

**BCOM E 1035 – මූල්‍ය ගිණුම්කරණය**

මුළු ප්‍රශ්ණ සංඛ්‍යාව 05 යි. කාලය : පැය 03 යි

සියළුම ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.

01. සීමිත සමාගමක ප්‍රධාන කාර්යාලය කොළඹද ශාඛාව ගාල්ලේ ද පිහිටා ඇති අතර ශාඛාව භාණ්ඩ ගනු ලබන්නේ ප්‍රධාන කාර්යාලයෙනි. 2010.03.31 දිනට පොත්වලින් උපුටාගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

(අ.)

| | කොළඹ | | ගාල්ල | |
|---|---|---|---|---|
| | (හර) රු. | (බැර) රු. | (හර) රු. | (බැර) රු. |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | - | 1025,000 | | |
| පිරියත හා යන්ත්‍ර | 995,465 | - | 461,600 | - |
| ලීබඩු | 65,000 | - | 45,000 | - |
| ක්ෂය සඳහා වෙන්කිරීම් (පිරියත හා යන්ත්‍ර) | - | 25,000 | - | 17,100 |
| ක්ෂය සඳහා වෙන්කිරීම් (ලී බඩු) | - | 7,000 | - | 2,500 |
| 2009.04.01 දිනට ලා/ලා ගිණුම | - | 65,000 | - | - |
| ණයගැති /ණයහිමි | 145,000 | 125,000 | 40,000 | 15,000 |
| අතැති මුදල් | 8,500 | - | 3,700 | - |
| බැංකු මුදල් | 12,500 | - | 7,750 | - |
| වේතන | 115,000 | | 37,000 | - |
| විදුලිය | 12,000 | | 6,400 | - |
| ගැනුම් | 775,000 | - | - | - |
| විකුණුම් | | 1,011,000 | | 620,000 |
| උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන්කිරීම් 2009.04.01 | - | 2,500 | - | - |
| පරිපාලන වියදම් | 5,335 | - | 1,200 | - |
| ප්‍රධාන කාර්යාලයෙන් යැවූ /ශාඛාවට ලැබුණු භාණ්ඩ | | 75,000 | 64,000 | - |
| විකුණුම් වියදම් | 86,700 | - | 12,450 | - |
| ජංගම ගිණුම් | 70,000 | | - | 52,000 |
| 2009.04.01 ආරම්භක තොග | 45,000 | | 27,500 | |
| | **2,335,500** | **2,335,500** | **706,600** | **706,600** |

අතිරේක තොරතුරු.

i 2010.03.27 දින රු. 11,000 වටිනා භාණ්ඩ ප්‍රධාන කාර්යාලය විසින් ගාල්ල ශාඛාවට යවන ලද අතර එම භාණ්ඩ 2010.04.02 වන තෙක්ම ශාඛාවට ලඟා වී නොතිබුනි.

ii ශාඛාව විසින් 2010.03.30 දින රු.7,000 වටිනා බැංකු අණකරයක් ප්‍රධාන කාර්යාලයට යවන ලදී. නමුත් එය ප්‍රධාන කාර්යාලයට ලඟා වූයේ 2010.03.31 න් පසුවය.

iii පිරියත හා යන්ත්‍ර සහ ලීබඩු පිලිවෙලින් වාර්ෂිකව 10% ක් හා 15% ක් බැගින් ලියා හල අගය මත ක්ෂය කළ යුතුය.

iv 2010.03.31 දිනට අවසන් තොගය පහත පරිදි විය.

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | රු. | 40,000 |
| ශාඛාව | රු. | 10,500 |

v ශාඛාවට අවශ්‍ය භාණ්ඩ ප්‍රධාන කාර්යාලය විසින් පිරිවැයට 10% ක් එකතු කොට ඉන්වොයිස් කරනු ලබයි.

ඔබ විසින්,

අ. i. ප්‍රධාන කාර්යාලය

ii. ශාඛාව සහ

iii. සමස්ථ ව්‍යාපාරය සඳහා 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තීරු ක්‍රමයට වෙළඳ හා ලාභාලාභ ගිණුම්

සහ

ආ. 2010.03.31 දිනට සමූහයේ ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

(ලකුණු 40)

02. 2010 ජනවාරි 01 දින " ග්ලෝබ් ප්‍රෙස් " ආයතනය මැෂිනරි සමාගමෙන් කුලීපිට ක්‍රමයට මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. යන්ත්‍රය භාර ගැනීමේදී රු. 30,000 ක ගෙවීමක් සිදුකල අතර ඉතිරිය රු. 20,000 බැගින් වූ සමාන වාර්ෂික වාරික තුනකින් දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු වේ. පොලී අනුපාතිකය වාර්ෂිකව 12 % කි. යන්ත්‍රයේ මුදල් වටිනාකම රු. 81,543 කි. සරල මාර්ගික ක්ෂය ක්‍රමය යටතේ වාර්ෂිකව 10% ක ක්ෂය වෙන්කිරීමක් කළ යුතු වේ.

ඔබ විසින්,

අ. පොලී ගණනය කිරීම සහ

ආ. ග්ලොබ් ප්‍රෙස් ආයතනයේ පොත් වල අවශ්‍ය ගිණුම් පිළියෙල කරන්න.

(මුළු ලකුණු 15)

03. අ. අකිලා සහ ශකිලා ලාභාලාභ සමව බෙදාගනිමින් බද්ධ ව්‍යාපාරයක නිරත වන හවුල් කරුවන්ය. අකිලා විසින් රු.50,000 වටිනා භාණ්ඩ බද්ධ ව්‍යාපාරයට සැපයූ අතර පහත වියදම් දරන ලදී.

| | | |
|---|---|---|
| විදුලිය | රු. | 1500 |
| ගෙවල් කුලී | රු. | 1750 |
| ප්‍රවාහන | රු. | 3250 |

ශකිලා විසින් රු. 14,000 වටිනා භාණ්ඩ සැපයූ අතර ඔහු දැරූ වියදම රු. 800 ක් විය. ශකිලා විසින් බද්ධ ව්‍යාපාරය වෙනුවෙන් භාණ්ඩ විකුණූ අතර රු. 92,000 ක් උපලබ්ධි විය. ශකිලා විකුණුම් මත 5% ක් වූ විකුණුම් කොමිස් මුදලකට හිමිකම් කියයි.

2010 මාර්තු 31 දින ගිණුම් පොත් පියවීමට හවුල් කරුවන් තීරණය කරන ලදී.

ඔබ විසින්,

අ. i. සිහිවටන බද්ධ ව්‍යාපාර ගිණුම සහ

ii. බද්ධ ව්‍යාපාරයේ එකිනෙක හවුල් කරුවන්ගේ ගිණුම් පිළියෙල කරන්න.

(ලකුණු 12)

ආ. බද්ධ ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර අතර වෙනස්කම් සඳහන් කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

04. ඒ, බී, සහ සී ලාභාලාභ 3:2:2 බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නිරතව සිටී. ඔවුන් 2010 මාර්තු 1 දින හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී. 2010 මාර්තු 01 දින උපුටා ගන්නා ලද ශේෂ පත්‍රය පහත වේ.

| වගකීම් | (රු.) | වත්කම් | (රු.) |
|---|---|---|---|
| ප්‍රාග්ධනය ඒ | 63,000 | ඉඩම් හා ගොඩනැගිලි | 81,000 |
| ප්‍රාග්ධනය බී | 60,000 | යන්ත්‍ර හා පිරියත | 72,000 |
| ප්‍රාග්ධන සී | 56,250 | ලී බඩු | 2,250 |
| සංචිත | 16,500 | තොග | 30,000 |
| විවිධ ණයහිමියෝ | 14,250 | විවිධ ණයගැතියෝ | 21,000 |
| | | බැංකු මුදල් | 3,750 |
| | 210,000 | | 210,000 |

අ. වත්කම් පහත වටිනාකම් වලින් උපලබ්ධි විය

ඉඩම් හා ගොඩනැගිලි රු. 125,250

යන්ත්‍ර හා පිරියත ශේෂ පත්‍රයේ අගයට

ලී බඩු රු. 50,000

තොග රු. 28,500

ණයගැතියෝ බොල් ණය රු. 2,000 ට යටත්ව ශේෂ පත්‍ර අගයට

ආ. ණයහිමියන්ට ගෙවීමේදී රු. 575 ක වට්ටමක් ලැබී ඇත.

ඇ. විසුරුවා හැරීමේ වියදම රු. 1,250

විසුරුවා හැරීම සම්බන්ධ සියලු තොරතුරු පෙන්වන අයුරින් අවශ්‍ය ගිණුම් පිළියෙල කරන්න.

(ලකුණු 15)

05. අ. පහත අයිතම සඳහා කුමන කොටසට බලපෑම් ඇතිවේද ?

05. අ. පහත අයිතම සඳහා කුමන කොටසට බලපෑම් ඇතිවේද ?

i). ක්ෂය වියදම

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

ii). ගෙවිය යුතු බැඳුම්කර වැඩි වීම (දිගුකාලීන වගකීම්)

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

iii). ව්‍යාපාරය භාවිතා කළ යන්ත්‍ර විකිණීමෙන් ලත් මුදල්

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

iv). උපකරණ විකිණීමේ අලාභ

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

v). ව්‍යාපාරය භාවිතා කළ ලීබඩු විකුණුම් ලාභ

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

vi). ගෙවිය යුතු ගිණුම් ශේෂය ඉහලයාම.

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

vii). සමාගමේ කොටස් මිලදී ගැනුම්

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

viii). වෙළඳ තොග ශේෂය ඉහළ යාම

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

ix). දිගුකාලීන ගෙවිය යුතු බැඳුම්කර නිදහස් කිරීම.

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය

x). අතිරේක සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල

i. මෙහෙයුම්

ii. ආයෝජන

iii. මූල්‍ය (ලකුණු 10)

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට (මුදල් ප්‍රවාහන ප්‍රකාශ ) අනුව කළයුතු හෙළිදරව් කිරීම් 05 ක් දක්වන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)